# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2022
### 2025 ජූලි

### සමාජීය විද්‍යා පීඨය

### ආර්ථිකවිද්‍යාව
### (නව නිර්දේශය)

### සාර්ව ආර්ථිකවිද්‍යාව ECON 38214

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. සාර්ව ආර්ථිකවිද්‍යාව විෂය ක්ෂේත්‍රය හඳුන්වා එහි ප්‍රධාන සංරචක අතර පවත්නා අන්තර් සම්බන්ධතාව නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 20)

02. අ) ජාතික ආදායමේ චක්‍රීය ප්‍රවාහය සිව් ආංශික ආකෘතිය ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

ආ) විවෘත ආර්ථිකයක ජාතික ගිණුම්වලට ඇතුළත් නොවන සේවා හඳුන්වා එයට තුඩුදෙන හේතු පැහැදිලි කරන්න. (ලකුණු 10)

03. කල්පිත ආර්ථිකයක වියදම් පිළිබඳ විස්තර පහත පරිදි දක්වා ඇත.

$C = 300 + 0.6\ YD$

$T = 0.3\ Y$

$G = 300,$

$TR = 100$

$I = 350$

$X = 150$

$IM = 130$

ඉහත තොරතුරු භාවිත කරමින්,

අ) මෙම ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම ගණනය කරන්න. (ලකුණු 08)

ආ) ආර්ථිකය සමතුලිතයට පත්වන විට පරිභෝජන මට්ටම සහ ඉතිරිකිරීම් සොයන්න. (ලකුණු 05)

ඇ) මෙම ආර්ථිකයේ විදීම් සහ කාන්දුවීම් ගණනය කරන්න. (ලකුණු 03)

ඈ) මෙම ආර්ථිකයේ ජාතික ආදායම් ගුණකයෙහි අගය සොයන්න. (ලකුණු 04)

04. උද්ධමනය සහ සේවා නියුක්තිය පිළිබඳ සම්භාව්‍ය න්‍යාය හා කේන්සියානු න්‍යාය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 20)

05. මහ බැංකු පොළී අනුපාත වෙනස්වීම රටක ආයෝජන සඳහා බලපාන ආකාරය ආයෝජනය පිළිබඳ න්‍යාය ඇසුරින් විමසන්න. (ලකුණු 20)

06. අ) IS-LM ආකෘතිය හඳුන්වන්න. (ලකුණු 06)

ආ) ප්‍රසාරණාත්මක මුදල් ප්‍රතිපත්තියකින් ඇතිවිය හැකි ආර්ථික ප්‍රතිවිපාක IS-LM ආකෘතිය උපයෝගී කරගෙන පැහැදිලි කරන්න. (ලකුණු 14)

07. සාපේක්ෂ වාසි න්‍යායේ පදනම කුමක්ද යන්න පැහැදිලි කර එය රටක ගෙවුම් ශේෂයට බලපාන ආකාර පහදන්න. (ලකුණු 20)

08. පහත සඳහන් නියමයන් කෙටියෙන් පැහැදිලි කරන්න.

අ) ව්‍යාපාර චක්‍ර

ආ) මුදල් ප්‍රතිපත්තිය සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය

ඇ) සැපයුම් කම්පන සහ ඉල්ලුම් කම්පන

ඈ) පාවෙන විනිමය අනුපාතය

(එක් කොටසකට ලකුණු 5 බැගින් ලකුණු 20)

******************************